(ii) එම පාසල් කවරේද;

(iii) එම එක් එක් පාසලේ ගුරු අතිරික්තයක් තිබෙන විෂයයන් හා ඒවාට අදාළව සිටින අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අධ්‍යාපන කොට්ඨාසයේ ගුරු හිඟයක් ඇති පාසල් කවරේද;

(ii) එම එක් එක් පාසලේ ගුරු හිඟයක් පවතින විෂයයන් හා එම එක් එක් විෂය සඳහා හිඟ ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගුරු හිඟය පියවීම සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1556/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෑත කාලයේදී නැගෙනහිර පළාතේ ඇති වූ ගංවතුර ගැලීම්වලදී අවතැන්වූ ජනතාවගේ සුභසාධනය සඳහා මහජන බැංකුව විසින් වෙන් කළ මුදල කොපමණද;

(ii) ඒ යටතේ සුභසාධන පහසුකම් ලබා ඇති අවතැන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් පවුලක් වෙනුවෙන් ලබාදී ඇති මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අවතැන්වූ ජනතාවට ලබාදීමට වෙන් කළ එම මූල්‍යාධාර, ඔවුන්ට ලබා දීම සඳහා භාරගත් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) අවතැන් වූ ජනතාව වෙනුවෙන් එම සුභසාධන කටයුතු ඉටු කළ බවට ඉදිරිපත් කළ හැකි සාක්ෂි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1610/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) පානදුර මහේස්ත්‍රාත් නිල නිවස පිහිටි පානදුර වෙරළ උද්‍යානය අසල තිබූ ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) එම ඉඩමේ හිමිකරුවන් කවුරුන්ද;

(iii) එකී නිල නිවස 2004.12.26 වැනි දින සිදුවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් හානියට පත්වූයේද;

(iv) හානියට පත් නිල නිවස සහ මායිම් තාප්පය අලුත්වැඩියා කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පානදුර මහේස්ත්‍රාත් නිල නිවාසය සහ එය පිහිටි ඉඩම පෞද්ගලික ආයතනයකට ආපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බදු දී ඇති බවත්;

(ii) මේ වන විට පානදුර මහේස්ත්‍රාත්වරයාට නිල නිවාසයක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත බදු දීම නිර්දේශ කළ අය හා ඒ සඳහා අනුමතිය ලබා දුන් අය කවුරුන්ද;

(ii) ඊට අදාළ බදු ගිවිසුම සභාගත කරන්නේද;

(iii) ඉහත කී දේපළෙහි සන්තකය අන්සතු කිරීමේදී අක්‍රමිකතාවයක් සහ හෝ දූෂණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඊට වගකිවයුතු තැනැත්තන්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1621/'11

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මිහින් ලංකා ආයතනයේ වත්මන් ඉහළ නිලධාරී මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබන අය කවුරුන්ද;

(ii) එම එක් එක් නිලධාරියාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) එම නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලබන වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිහින් ලංකා ආයතනයේ 2010 වර්ෂයේ ශේෂ පත්‍රය අනුව රුපියල් බිලියන 5.6ක වත්කම් හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2016/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිතුල් නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවල එම වැඩසටහන් ක්‍රියාත්මකද;

(ii) එසේ නම්, අදාළ වැඩසටහන් යටතේ කිතුල් කර්මාන්තයේ යෙදෙන්නන්ට ලබා දෙන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2045/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ ඇති සියලුම පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස තුළ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිවී තිබේද;

(ii) නොඑසේ නම්, සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම කොට්ඨාසවල නම් කවරේද;

(iv) දැනට සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති කොට්ඨාසවලට සෞඛ්‍ය මධ්‍යස්ථාන ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1539/'11

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) හබරාදූව අධ්‍යාපන කොට්ඨාසයට අයත්, පුස්සැල්කඩ ආදර්ශ කණිටු විද්‍යාලයේ වර්ෂ 2003 සිට 2010 දක්වා, එක් එක් වර්ෂය ආරම්භයේදී,

(i) ඒ ඒ ශ්‍රේණිවල සිටි සිසුන් සංඛ්‍යාව හා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්පත් යොමුකළ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2004 න් පසු එම පාසලේ ප්‍රගතියක් ඇති වී තිබෙන බව පිළිගන්නේද;

(ii) එම ප්‍රගතිය සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1544/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවට ලිමොසින් නමැති අධි සුඛෝපභෝගී වාහන වර්ගය ආනයනය කිරීම සඳහා අවසර දීමට හේතු කවරේද;

(ii) මේ දක්වා ආනයනය කර ඇති ලිමොසින් වර්ගයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ආනයනය කරන ලද ලිමොසින් වර්ගයේ වාහනයක වටිනාකම කොපමණද;

(iv) ලිමොසින් වර්ගයේ වාහනයක් නිෂ්කාශණය කිරීම සඳහා ගෙවන ලද තීරු බදු සහ අනෙකුත් බදු ප්‍රමාණය කවරේද;

(v) එකී වාහන නිෂ්කාශණය කරගත් අයගේ නම් සහ ඒවා නිෂ්කාශණය කරගත් දිනයන් කවරේද;

(vi) ඉහතකී වාහනය සුඛෝපභෝගී වාහනයක් ලෙසින් වර්ගීකරණය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එන්ජින් ධාරිතාව 1000CC ට වඩා අඩු සහ 1000CC - 2000CC අතර ත්‍රිරෝද රථ සහ අනෙකුත් වාහනවලට අදාළ ආනයන බදු ප්‍රමාණය කවරේද;

(ii) අනෙකුත් සුඛෝපභෝගී වාහනවලට ආනයනයේදී අදාළවන තීරු බදු ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ආ) (ii) හි සඳහන් වාහනවලට අදාළ තීරු බදු අධි සුඛෝපභෝගී ලිමොසින් වර්ගයේ වාහන සඳහාද අය කළ යුතුව තිබුනේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1582/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි නෙටොල්පිටිය, පට්ටියපොළ ග්‍රාමීය බලශක්ති මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන අතහැර දැමීම හේතුවෙන් විනාශ වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම විදුලිබල මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සපයා ගත් අරමුදල කවරේද;

(ii) එය ඉදිකිරීම සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එමගින් විදුලිබලය සපයන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පට්ටියපොළ ග්‍රාමීය බලශක්ති මධ්‍යස්ථානය භාවිතයට නොගෙන අතහැර දැමීමට හේතුවූ කරුණු කවරේද;

(ii) එම මධ්‍යස්ථානය සතු සම්පත් විදුලි ව්‍යාපෘතියකට හෝ වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම අපේක්ෂිත කටයුත්ත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1628/'11

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2002 සිට මේ දක්වා අධ්‍යාපන විද්‍යා පීඨවලින් පිට වූ ගුරුවරුන්ගෙන් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි නමුත්, දැනට උතුරු මැද පළාතේ සේවය කරන ගුරුවරු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව කොපමණද;

(ii) එම ගුරුවරුන්ට උතුරු මැද පළාතෙන් නිදහස්වී තම පදිංචි ප්‍රදේශවලට ස්ථාන මාරු ලබා ගැනීම සඳහා ඔවුන් වෙනුවෙන් වෙනත් ගුරුවරුන් එම පළාතට යෙදවීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට තිබේද;

(iii) දුෂ්කර සේවය නිම කළ ඉහත සඳහන් ගුරුවරුන්ගේ සාධාරණ ඉල්ලීම් සලකා බලා ලබා දී ඇති ස්ථාන මාරුවීම් සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි ඉල්ලීම් මත ස්ථානමාරු ලබා නොදුන් ගුරුවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය කර ඇති මැදිහත්වීම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1857/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, පාලකුඩා මංසන්ධියේ සිට තලවිල ශාන්ත ආනා දේවස්ථානය දක්වා දිවෙන මාර්ගය පිළිසකර කිරීම සඳහා 2011 වර්ෂයේදී වෙන් කළ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කිරීමට ඇස්තමේන්තුගත කර ඇති මාර්ගයේ දිග හා පළල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය පිළිසකර කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(ii) එම මාර්ගය පිළිසකර කළ ආයතනයේ නම, එහි අයිතිකරුගේ නම, ලිපිනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු කවරේද;

(iii) මාර්ගය ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් එම සමාගමට ගෙවිය යුතු සියලු ගෙවීම් මේ වන විට ගෙවා අවසන් කර තිබේද;

(iv) නොඑසේ නම්, තවදුරටත් ගෙවීමට ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පිළිසකර කිරීමෙන් පසුව ඉහත මාර්ගය මත තල් හෝ වෙනත් ශාක වර්ගයක් පැළවී තිබේද;

(ii) නියමිත ප්‍රමිතියට සකස් කළ විට මාර්ගයක් මත ශාක වර්ග පැළවීමේ හැකියාවක් තිබේද:

(iii) ඉහත මාර්ගයේ ශාක වර්ග පැළවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1997/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004.07.22 දිනැති අංක PS/CS/26/2004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සිංහරාජ ලෝක උරුම වන භූමියට යාව, එහි සිට කිලෝමීටර් 1/2 ක දුර ප්‍රමාණය තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් සියලුම වනාන්තර ඉඩම් 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 (1) (ඊ) සහ 44(එ) වගන්ති අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා නිර්දේශ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කටයුතු කර තිබේද;

(ii) එකී අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව හෙක්ටයාර් 2508.4ක වනාන්තර බිම් ප්‍රමාණයක් සිංහරාජයට අලුතින් එකතු කිරීමට නියමිතව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2017/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පූජා භූමි ආශ්‍රිතව අනවසරයෙන් ජීවත්වන පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, කවර පූජාභූමි කේන්ද්‍රකර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 මාර්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0657/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රට තුළ ඇති රජයට අයත් විශාලතම ව්‍යාපාර 30 කවරේද;

(ii) ඒවා රජය සතු විශාලතම ව්‍යාපාර 30 ලෙස සලකනු ලබන්නේ කවර පදනමකින්ද;

(iii) එක් එක් ආයතනයෙහි ආයෝජනය කරන ලද මූලධන ප්‍රමාණය හා දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් ආයතනයෙහි ලාභ හෝ පාඩු වාර්ෂික පදනමින් කොපමණද;

(v) රජය සතු, එක් එක් ව්‍යාපාරයෙහි වෙළඳපොළ කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපාර අතරින් පාඩු ලබන සෑම ආයතනයක්ම ලාභ ලබන තත්ත්වයට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1110/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයට අයත්, ජයවර්ධනපුර අධ්‍යාපන කලාප කාර්යාලය මඟින් පාලනය වන සුබෝධි කණිෂ්ඨ විද්‍යාලයේ සිසුවියන් හය ශ්‍රේණිය සඳහා මාලබේ රාහුල බාලිකා විද්‍යාලයට ඇතුළත් කර ගන්නා බවත්;

(ii) එම විදුහලේ විදුහල්පතිවරයා හය ශ්‍රේණියට ළමයින් ඇතුළත් කර ගැනීමේදී පහසුකම් සහ වෙනත් ගාස්තු ලෙස එක් ළමයකුගෙන් රු. 3162ක මුදලක් රිසිට්පත් නිකුත් කොට අය කරන බවත්;

(iii) එම මුදලට අමතරව රිසිට්පත් ලබාදීමකින් තොරව ඩෙස් බංකු සඳහා වියදම් ලෙස පවසමින් තවත් රුපියල් හයදහසක මුදලක් අය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාලබේ රාහුල බාලිකා විද්‍යාලයේ විදුහල්පතිවරයාට ඉහත පරිදි මුදල් අය කිරීමට බලයක් තිබේද;

(ii) එසේ නොමැති නම්, එම මුදල් අයකිරීම පිළිබඳව විමර්ශනයක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1560/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හමුදා කඳවුරු තුළ දී විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට ලබා දෙන ආකාරයේ නායකත්ව පුහුණු වැඩසටහනක් රජයේ පාසල්වල විදුහල්පතිවරුන් සඳහාද පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) විදුහල්පතිවරුන්ට එවැනි පුහුණුවක් ලබාදීමට හේතු කවරේද;

(iii) එම වැඩසටහන පැවැත්වීම සඳහා සුදුසු ස්ථාන තෝරා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිවරුන් සඳහා විනය සහ අනෙකුත් කටයුතු පිළිබඳ පුහුණුව ලබාදීමට සුදුසු වෙනත් ආයතන මේ වන විට අප රට තුළ තිබේද;

(ii) එසේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ආකාරයේ පුහුණුවක් ලබාදීම තුළින් විවිධ රෝග ආබාධ තත්ත්වයන් සහිත විදුහල්පතිවරුන්ගේ ජීවිත අවදානමකට ලක්විය හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1629/'11

ගරු අනුර දිසානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පින්නවල අලි අනාථාගාරයේ සිටින අලින් හා ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2005 සිට මේ දක්වා පූජා කිරීම හෝ පරිත්‍යාග කිරීම සඳහා අලි අනාථාගාරයෙන් ලබා ගෙන ඇති අලින්, කෙනෙරුන්, ඇතුන් හෝ ඇතින්නියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ලබාගත් අය කවුරුන්ද;

(iv) එසේ ලබාගත් අලි ඇතුන් පූජා කිරීම හෝ පරිත්‍යාග කිරීම සිදුකරනු ලැබූ අය කවුරුන්ද;

(v) පූජා කිරීම් හෝ පරිත්‍යාග කිරීම් සිදුකරනු ලැබූ විහාරස්ථාන, ආයතන හෝ පුද්ගලයින් කවරේද;

(vi) පූජා කරනු ලැබූ හෝ පරිත්‍යාග කරනු ලැබූ අලි ඇතුන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට දියත් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1998/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිමල් පුංචිහේවා නමැති අයෙකු,

(i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරමින් වැටුපක් ලබන බවත්;

(ii) ඊට අමතරව ඔහු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අතිරේක ලේකම් (නීති) ලෙස කටයුතු කරමින්ද වැටුපක් ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිමල් පුංචිහේවා යන අයගේ වයස අවුරුදු 60 ඉක්මවා තිබේද;

(ii) රජයේ තනතුරු 2ක් එකවර දැරීම සඳහා නිමල් පුංචිහේවා යන අයට කැබිනට් මණ්ඩල අනුමතියක් ලැබී තිබේද;

(iii) නොඑසේ නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2018/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ, වෙරළබඩ ප්‍රදේශවල පසුගිය වර්ෂ 30 කට අධික කාලයක් තුළ විනාශයට පත්වෙමින් ඇති කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමට මේ වන විට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකාවේ ප්‍රධානතම වශයෙන් වී වගා කරනු ලබන අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි සේනානායක සමුද්‍රය හා ඒ අවට ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව්, වේලි සහ කෘෂිකාර්මික ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට ලෝක බැංකුවෙන් මුදල් ලබා ගෙන තිබේද;

(ii) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන තිබේ නම්, අදාළ විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1545/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වසරකට සංසරණයෙන් ඉවත්කර ගනු ලබන භාවිතයට නුසුදුසු මුදල් නෝට්ටු සංඛ්‍යාව කොපමණද;

(ii) භාවිතයට නුසුදුසු මුදල් නෝට්ටු වෙනුවට නව මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා වන පිරිවැය කොපමණද;

(iii) ඉහත කී කරුණ සඳහා නව මුදල් නෝට්ටු මුද්‍රණය නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන් පසු සිදු කරනු ලැබුවේද;

(iv) එසේ නම්, අවසාන ටෙන්ඩරය සඳහා ලැබුණු සාපේක්ෂ මිල ගණන් කවරේද;

(v) එම ටෙන්ඩරය ලබාගත් අයගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසරකට සංසරණය වන ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව කොපමණද; සහ

(ii) රට තුළ ව්‍යාජ මුදල් නෝට්ටු සංසරණය අඩු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1583/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕවිටිගමුව උතුර නිල්වලා ප්‍රජා මූල සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද ජල ව්‍යාපෘතිය මේ වන විට අක්‍රියව පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය මගින් ජලය සපයන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ජල ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් ලැබුනේ, දේශීය මූලාශ්‍ර මගින්ද; නැතිනම්, විදේශීය මූලාශ්‍ර මගින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඕවිටිගමුව ජල යෝජනා ක්‍රමය නැවතත් සංවර්ධනය කර ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා කඩිනමින් සපයා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1700/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩු දුම්රිය ස්ථානයේ සිට තලෙයිමන්නාරම දක්වා දුම්රිය මාර්ගයේ දුර කොපමණද;

(ii) මඩු සිට තලෙයිමන්නාරම දක්වා දුම්රිය මාර්ගය පිළිසකර කරනු ලබන සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරාගනු ලැබීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(iv) එම මාර්ගය ඉදිකිරීම සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(v) එම මුදල් සපයාගනු ලබන ආකාරය කවරේද;

(vi) ණය මුදලක් මගින් එම මුදල් සපයා ගනු ලබන්නේ නම් ඊට අදාළ පොලී අනුපාතයන් හා එම ණය ආපසු ගෙවීමේ කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1858/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාම නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා 2011 වර්ෂයට පෙර පැවති තරඟ විභාගයෙන් සමත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රතිඵල අනුව ග්‍රාම නිලධාරී පත්වීම් ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පත්වීම් ලබාදීමේදී සලකා බැලූ අවම ලකුණු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරී තනතුර සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් පත්කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම පත්වීම් ලබා දෙන පදනම කවරේද;

(iii) තරඟ විභාගයෙන් සමත්ව එකී තනතුර නොලැබූ පිරිසක් සිටියදී ඔවුන් නොසලකා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ග්‍රාම නිලධාරී පත්වීම් ලබාදීම අසාධාරණ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1999/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කරන නිමල් පුංචිහේවා නමැති අය මාසිකව ලබන වැටුප සහ අනෙකුත් දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔහු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබාදුන් නිලරථයක් භාවිතා කරන්නේද;

(iii) එම තැනැත්තා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කිරීමට අමතරව වෙනත් රජයේ රැකියාවකද යෙදෙන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත හෙළිදරව් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කිරීම වෙනුවෙන් රුපියල් අසූ දහසක (රු. 80,000/-) වැටුපක් ලබන බවත්;

(ii) එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ රථයක්ද නිල රථයක් ලෙස භාවිතා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2019/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බටහිර ආසියාවේ සහ උතුරු අප්‍රිකානු රටවල වැඩි වශයෙන්ම වගා කරනු ලබන "Phoenix Dactylifera" නම් දිගටි, දුඹුරු පැහැති, මිහිරි රසැති, කෑමට ගන්නා පළතුරක් වූ රට ඉඳි වර්ගය, මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි නගරයේ අත්හදා බැලීමේ පදනමින් වගා කළ බවත් එය සාර්ථක වූ බවත්, එතුමා දන්නෙහිද?

(ආ) දේශීයව රට ඉඳි වගා කිරීම සඳහා යෝග්‍ය ප්‍රදේශවල පුළුල් පාංශු අධ්‍යයනයක් සිදු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1546/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට වරායේ ඉදිකිරීම් කටයුතු අවසන් වන විට එහි ශ්‍රමය සඳහා වූ වියදම කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරායේ ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවයේ නිරතව සිටින විදේශ ශ්‍රමිකයින් සංඛ්‍යාව සහ දේශීය ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට රැගෙන ආ සමාගම හෝ රට විසින් ඔවුන්ට ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සේවකයින් වෙනුවෙන්, සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවා ඇති දායක මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1585/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1999 වර්ෂයේදී කලුතර ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මතුගම ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල යෝජනා ක්‍රමය සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සපයා ගන්නා ලද්දේ දේශීය අරමුදල්වලින්ද;

(iii) නොඑසේ නම්, විදේශ ආධාර මගින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය මගින් ජලය සැපයීමට අපේක්ෂා කරන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට එම අපේක්ෂිත පවුල් සංඛ්‍යාවට ජලය සැපයීමට හැකි වී තිබේද;

(iii) මතුගම ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී විශාල ලෙස මූල්‍ය වංචා සිදුවී ඇති බවට චෝදනා එල්ලවී තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳව විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1863/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ඇති ප්‍රේක්ෂක ආසන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් ආසනයක් සවි කිරීම සඳහා ගිය වියදම කොපමණද;

(iii) එම ආසන සැපයූ ආයතනය කුමක්ද;

(iv) එක් ආසනයක් සපයා ඇති මුදල කොපමණද;

(v) ආසන මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(vi) එසේ නම්, ටෙන්ඩර් සඳහා ඉල්ලුම් කළ ඉල්ලුම්කරුවන්ගේ නම්, ලිපිනය, ඉල්ලුම් කළ ටෙන්ඩර් මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දඹුල්ල ක්‍රිකට් ක්‍රීඩාංගනයේ එක් ප්‍රේක්ෂක ආසනයක් සඳහා ගිය වියදම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
## (2012 මාර්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා)

1165/'11

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) වර්ෂ 1980 සිට 2011 පෙබරවාරි මාසය දක්වා රජයේ සේවකයින් සංඛ්‍යාව වැඩිවී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාල සීමාව තුළ ජීවන වියදම් දර්ශකය වැඩි වී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1460/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, මාදම්පා - වේරගොඩ විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මාදම්පා - වේරගොඩ විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1461/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඇල්පිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1462/'11

ගරු අජිත් කුමාර මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය - දිවිතුර විවිධ සේවා සමුපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වැලිවිටිය - දිවිතුර විවිධ සේවා සමුපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම් ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1463/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බද්දේගම විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1464/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඉහල ලේල්වල විවිධ සේවා සමූපකාර සමිතියේ ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;
(iv) එම කාරක සභාවන් කවරේද;
(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;
(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;
(iii) එම සමිතියේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;
(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්‍ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;
(v) ඔවුන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;
(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහල ලේල්වල විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;
(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;
(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;
(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;
(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1465/’11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;
(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;
(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;
(iv) එම කාරක සභාවන් කවරේද;
(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;
(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;
(iii) එම සමිතියේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;
(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්‍ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;
(v) ඔවුන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;
(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හිනිදුම විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1516/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම - පිටිගල විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නියාගම - පිටිගල විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම් ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1517/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්‍ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) හික්කඩුව විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1518/'11

ගරු අජිත් කුමාර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, යටලමත්ත - නාගොඩ විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා සාමාජික අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පිහිටුවා ඇති කාරක සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එම කාරක සභාවන් කවරේද;

(v) කාරක සභා නියෝජිතයන්ගේ නම්, ලිපිනයන් හා කාරක සභාවේ දරන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමිතියට අදාළ මහා සභා නියෝජිතයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා එක් එක් නියෝජිතයා නියෝජනය කරන කාරක සභාව කවරේද;

(iii) එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

(v) ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ දිනයන් කවරේද;

(vi) පත්වූ ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) යටලමත්ත - නාගොඩ විවිධ සේවා සමූපකාර සමිතියේ,

(i) සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවකයන්ගේ නම්, ලිපිනයන් හා තනතුරු කවරේද;

(iii) මුළු වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) බැංකු අයිරා තිබේ නම්, ඒවායේ අගය කොපමණද;

(v) පසුගිය වර්ෂ 10 තුළ ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 මාර්තු මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0658/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රටේ මූල්‍ය කටයුතු සහ රෙගුලාසි අධීක්ෂණය කරනු ලබන රාජ්‍ය ආයතනය කවරේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කරන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 සිට මේ දක්වා බංකොලොත්භාවයට පත්ව ඇති මූල්‍ය සමාගම්හි බංකොලොත්භාවයට හේතු වූ කාරණා කවරේද;

(ii) ඉහත කී මූල්‍ය සමාගම් අයහපත් ආකාරයකින් පවත්වාගෙන යමින් තිබියදී ඒ සම්බන්ධයෙන් මහ බැංකුවේ අධීක්ෂණ ඒකකය විසින් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අසාර්ථක වූ මූල්‍ය සමාගම් විසින් ගෙවීම් පැහැර හරිනු ලැබ ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මුදල් ආපසු ගෙවනු ලැබූ තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව කවරේද;

(iii) ඔවුන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත කී කාල පරිච්ඡේදය තුළ මහ බැංකුවේ අධිපති ධුරය දැරූ තැනැත්තාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1114/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති පාසල්වල ගුරු පුරප්පාඩු පිරවීමට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා 2007 වර්ෂයේදී පැවති තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව වර්ෂ 2010 ජූලි මස පැවති සම්මුඛ පරීක්ෂණයේදී එම විභාගයෙන් ලබා ගත් ලකුණුවලට අමතරව අපේක්ෂකයින් සඳහා ලකුණු ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2007 වර්ෂයේදී පවත්වන ලද තරඟ විභාගයේදී වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් නොසලකා හැර අඩු ලකුණු ලැබූ අයදුම්කරුවන්ට මේ වනවිට පත්වීම් ලබා දී තිබේද;

(ii) එලෙස අඩු ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ට පත්වීම් ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1561/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබා දෙන නායකත්ව පුහුණුව අතරතුර දී ආබාධයන්ට ලක්වූ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආබාධ තත්ත්වයන් පිළිබඳ විස්තර කවරේද;

(iii) එම පුහුණුවේ දෛනික කාල සටහන කුමක්ද;

(iv) එම පුහුණුව අතරතුරදී රෝගී වූ දරුවන් නැවත නිවෙස් වෙත කැඳවාගෙන යාම සඳහා එම දරුවන්ගේ දෙමව්පියන් විසින් ඉල්ලීම් කර තිබුනේද;

(v) අදාළ පුහුණුවීම් කටයුතු සඳහා වෙන් කර ඇති එක් එක් ආරක්ෂක හමුදා කඳවුරේ ස්නානය කිරීමේ පහසුකම්, වැසිකිළි සංඛ්‍යාව සහ අනෙකුත් සනීපාරක්ෂක පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2000/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිමල් පුංචිහේවා නමැති අයෙකු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ තනතුරක් දැරීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඔහුගේ උපන්දිනය කවදාද;

(iii) එම තැනැත්තාගේ වයස අවුරුදු 60 ඉකුත් වූ පසුවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමතියක් ලබාදී තිබේද;

(iv) එසේ නම් ඒ කවදාද;

(v) එවැනි අනුමතියක් ලබාදී නොමැති නම්, වයස අවුරුදු 60 ඉකුත් වූ දිනයේ සිට මේ දක්වා එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කර ඇත්තේ අනීතිකව බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2055/'11

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් "කලුගඟ ද්‍රෝණිය තුළ ජල සම්පත් සංවර්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීම හා ගං ජලය නිසා රත්නපුර හා කලුතර දිස්ත්‍රික්කවල සිදුවන ගංවතුර තත්වය අවම කිරීමට විසඳුම් සෙවීම" යන හිසින් අදාළ දිස්ත්‍රික්ක ලේකම්වරුන් වෙත ලිපියක් යවා ඇති බවත්;

(ii) එම ලිපිය මගින් දිස්ත්‍රික් කෘෂිකර්ම සංවර්ධන කමිටුවලදී අදාළ දේශපාලන අධිකාරිය සහ රේඛීය ආයතන දැනුවත් කරන ලෙස ඉල්ලා ඇති බවත්;

(iii) මෙම වැඩපිළිවෙළ යටතේ මල්වල හා අවට ප්‍රදේශයන්හි අදාළ මිනුම් කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත්;

(iv) මෙම කටයුතු පිළිබඳව ප්‍රදේශයේ ජනතාව නිසියාකාරව දැනුවත් නොකිරීම නිසා ඔවුන් තුළ නොසන්සුන්කාරී තත්වයක් ජනිතවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ලිපිය නිකුත් කළ දිනට පසු රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වාර දෙකක් කැඳවා ඇතත් මෙම කරුණු න්‍යාය පත්‍රයට හෝ ඇතුළත් නොවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2056/'11

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා පත් කරනු ලබන්නේ 2008 අංක 31 දරන පනතෙහි දක්වා ඇති විධිවිධානයන් යටතේ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උප කුලපති තනතුරෙහි වර්තමාන තත්ත්වය කවරේද;

(ii) වර්තමාන උපකුලපතිවරයාට 2010 ජනවාරි මාසයෙන් පසු අක්‍රමවත් ලෙස තවදුරටත් එම තනතුරේ රැඳී සිටීමට අවසර දීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයාගේ නම කවරේද;

(iii) වර්තමාන උපකුලපතිවරයා ප්‍රධානත්වය දරන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේදී සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේදී ගනු ලබන තීරණ සම්බන්ධයෙන් වගකීම භාරගන්නා පුද්ගලයාගේ නම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;
(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;
(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;
(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;
(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද; සහ
(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1547/'11

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල ගුවන් තොටුපල ඉදිකිරීම් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;
(ii) මත්තල ගුවන් තොටුපල ඉදිකිරීම් අවසන් කරන විට ඒ සඳහා වූ ශ්‍රමය සඳහා වන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මත්තල ගුවන් තොටුපල ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවයේ නිරතව සිටින විදේශ ශ්‍රමිකයින් සංඛ්‍යාව සහ දේශීය ශ්‍රමිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට රැගෙන ආ සමාගම හෝ රට විසින් ඔවුන්ට ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;
(iii) මත්තල ගුවන් තොටුපල ව්‍යාපෘතියේ සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාරත්ව අරමුදල වෙත ගෙවනු ලබන දායක මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1586/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, සිරිසමන්පුර - ඇරවක්ඔය හරහා ඇති හීන්දෙණියාවල පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නැවතී වර්ෂ ගණනාවක් ගතවී ඇති බවත්;
(ii) මේ නිසා ගම්මාන රැසක ජනතාව දැඩි අපහසුතාවයකට මුහුණ පාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ වර්ෂය කවරේද;
(ii) එහි ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදෙන ආයතනය හෝ ආයතන කවරේද;
(iii) හීන්දෙණියාවල පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;
(iv) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;
(v) ඒ ඒ ආයතන මගින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;
(vi) ටෙන්ඩර් පිරිනමන ලද ආයතනය හා අදාල ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ඈ) (i) පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) මෙම පාලම ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1868/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සේවය කරන ස්ථිර සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ටෙලිකොම් ආයතනයේ දිවයින පුරා ඇති ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන ස්ථිර සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මාසිකව ලබන වැටුප, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතනයේ අනෙකුත් විධායක ශ්‍රේණියේ නිලධාරීන් මාසිකව ලබන වැටුප, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2008 දක්වා සහ 2011.01.01 දින සිට 2011.09.01 දින දක්වා කාල සීමාව තුළදී කලුතර දිස්ත්‍රික්කය තුළ ලබා දෙන ලද මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2010 වර්ෂය සඳහා කලුතර දිස්ත්‍රික්කය තුළ මත්පැන් බලපත්‍ර ලබාදුන් තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1548/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දකුණ වරායේ දියකඩනය ඉදිකිරීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) දියකඩනය ඉදිකිරීම අවසන් කරන අවස්ථාව වන විට ශ්‍රමය වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දියකඩනය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවය සඳහා යොදවන ලද විදේශීය සහ දේශීය සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශීය සේවකයන් ශ්‍රී ලංකාවට රැගෙන එන ලද රට හෝ සමාගම විසින් ඔවුන්ට ලබාදී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) දියකඩනය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1587/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක්‍රීඩා අමාත්‍යාංශයට අනුබද්ධ ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂ ධූරය වසර ගණනාවක සිට පුරප්පාඩුව පවතින බවත්;

(ii) ක්‍රීඩා අමාත්‍යාංශයේ සේවය අතහැර විදේශගතව සිටින පුද්ගලයෙකු එම තනතුර සඳහා පත් කිරීමට සූදානමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තනතුරට අදාළ සුදුසුකම් කවරේද;

(ii) ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂ ධූරය සඳහා අයදුම්පත් කැඳවා තිබියදීත් සම්මුඛ පරීක්ෂණ නොපැවැත්වීමට හේතු කවරේද;

(iii) එම තනතුර සඳහා සුදුසුකම්ලත් අයකු තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1869/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පාරිභෝගික දුරකථන සම්බන්ධතාවලින් ලැබූ ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් පාරිභෝගිකයින් වෙත රැහැන් රහිත ස්ථාවර දුරකථන (CDMA) ලබා දීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) අද වන විට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලබා දුන් CDMA දුරකථන භාවිතා කරන පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතනය CDMA දුරකථන ලබාදීම ආරම්භ කළ දින සිට මේ දක්වා එමගින් ලැබූ ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ටෙලිකොම් ආයතනය විසින් ආරම්භයේදී CDMA දුරකථන සම්බන්ධතාවයක් ලබා දුන් මිල සහ එම දුරකථන සම්බන්ධතාවයක් ලබා දෙන වත්මන් මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2005/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුගඟේ ගංවතුර පාලනය කිරීම සඳහා ජයිකා (JAICA) ආයතනය සමඟ එක්ව මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කලුගඟ ඉවුරේ බැම්මක් ඉදි කිරීමට සැලසුම් කර තිබේද;

(ii) නොඑසේ නම්, සැලසුම් කරමින් තිබේද;

(iii) එම සැලසුම් සකස් කිරීම සඳහා දැනට වියදම් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සැලසුම් සකස් කිරීමේදී කලුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අදහස් විමසනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) වෙනත් මහජන නියෝජිතයන්ගේ අදහස් විමසන ලද්දේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

(v) නොඑසේ නම්, මහජන නියෝජිතයන්ගේ අදහස් නොවිමසා ඉහත කී ව්‍යාපෘතිය සැලසුම් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත කී ව්‍යාපෘතිය හේතුකොට ගෙන කලුතර දිස්ත්‍රික්කයේ පරිසරයට සිදුවන බලපෑම පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම අධ්‍යයනය සිදු කළ අය කවුරුන්ද;

(iii) එම අධ්‍යයනයට අදාල වාර්තාවේ පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?